# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2014

### 2018 අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර්

### මානවශාස්ත්‍ර පීඨය

### බෞද්ධ සංස්කෘතිය

**බෞද්ධ මූලාශ්‍රය හා සාහිත්‍යය අධ්‍යයනය BUCU E - 1025**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

1. දීඝ නිකායේ මහා පරිනිබ්බාන සූත්‍රය, බුද්ධ චරිතය විවරණය වන ප්‍රාමාණික මූලාශ්‍රයක් ලෙස සැලකීමේ යුක්තිය ප්‍රකට කරන්න.

2. සදාචාරාත්මක යහ පැවැත්ම සඳහා සමාජගත දේශපාලනික හා ආර්ථික සංස්ථාවන්ගේ උපයෝගීතාව කූටදන්ත සූත්‍රානුසාරයෙන් විභාග කරන්න.

3. සිගාලෝවාද සූත්‍රාගත ඉගැන්වීම් වල සමාජානුගත අවශ්‍යතා සනිදර්ශනව පෙන්වා දෙන්න.

4. සෞන්දර්ය හා රසාස්වාදය පිළිබඳ බෞද්ධ විග්‍රහය යථාර්ථවාදී චින්තනයක් බව දීඝනිකායේ සක්කපඤ්හ සූත්‍රානුසාරයෙන් සාකච්ඡා කරන්න.

5. භික්ෂු විනය අරමුණු කරගත් සේඛියා ධර්මයන්ගේ බෞද්ධ සංස්කෘතික උපයෝගීතාව විමර්ශනය කරන්න.

6. ශ්‍රී ලාංකේය ජාතිය සතු උරුමය වාර්තාගත කිරීමෙහිලා වංශ කථාවන්ගෙන් වූ මෙහෙවර අගය කරන්න.

7. බෞද්ධ සංස්කෘතික සංකල්ප සමාජගත කිරීමෙහිලා භාවිත ජනකාන්ත මාධ්‍යයක් ලෙස සිංහල බෞද්ධ මහා කාව්‍යාගත ආකෘතිය ගෙන හැර දක්වන්න.

8. බුද්ධ චරිතය ඇසුරින් ශ්‍රද්ධා බුද්ධි සම්පන්න ආකල්පයක් ගොඩනැගීමෙහිලා බුත්සරණ කතුවරයා ගත් උත්සාහය ප්‍රමාණ කරන්න.

9. ආගමික අරමුණු හා සංස්කෘතික ආකල්ප ගොඩනැගීමේ මාධ්‍යයක් ලෙස බෞද්ධ උපදේශ සාහිත්‍යයේ කාර්ය භාරය ලෝවැඩ සඟරාව ඇසුරින් විමර්ශනය කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට ප්‍රමාණවත් විවරණ සපයන්න.
    - i ජාතක පොත් වහන්සේ
    - ii බුදුගුණ අලංකාරය
    - iii අරියපරියේසන සූත්‍රය (ම.නි.)
    - iv කෝසල සංයුක්ත (සං.නි.)

**********************